www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ඉරාන ගෑස් නල මාර්ගය අතහරින ලෙස ඉන්දියාවට හා පකිස්තානයට බල කරයි

## US Secretary of State presses India and Pakistan to abandon Iranian gas pipeline

**කේ. රත්නායක විසිනි**

**2005 මාර්තු 31**

එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ලෙස මාර්තු මැද දකුනු ආසියාවට කල සිය ප්‍රථම සංචාරය තුල දී කොන්ඩලීසා රයිස්ගේ ඉහල ම ප්‍රමුඛතාවන්ගෙන් එකක් වූයේ, ඉරානයේ සිට ප්‍රධාන ගෑස් නල මාර්ගයක් ඉදි කිරීමේ සැලසුම් අතහැර දමන ලෙස ඉන්දියාවට හා පකිස්තානයට බල කිරීම යි. මෙම ව්‍යාපෘතිය රටවල් දෙකට ම සැලකිය යුතු වාසි අත්පත් කර දෙනු ඇති නමුදු, එය ටෙහෙරානයට එරෙහිව බුෂ් ආන්ඩුව ගෙන යන, ආර්ථිකව හුදකලා කිරීමෙන් හා මිලිටරි තර්ජනයන්ගෙන් සමන්විත, ආක්‍රමනකාරි ව්‍යාපාරය සමග ගැටෙයි.

ඇමරිකාවේ මිත්‍ර රටවල් දෙකට කල රයිස්ගේ මෙම සංචාරය ඇත්ත වසයෙන් ම සුහදශීලී විය. ඒකාබද්ධ ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, ඉන්දියානු විදේශ ඇමති කුන්වාර් නට්වාර් සිං, රයිස්ගේ දේශපාලන දෘෂ්ටිය පිලිබඳව ඇයට ප්‍රශංසා කොට “අපගේ අන්‍යොන්‍ය වාසිය පිනිස අපගේ ගෝලීය අනාගතය හැඩගැස්වීමෙහි ලා” එක්සත් ජනපද-ඉන්දියානු සබඳතාවන් සතු විභවය ගැන කතා කලේ ය. රයිස් ද ඊට ගැලපෙන ආකාරයෙන් ප්‍රතිචාර දක්වූයේ, එක්සත් ජනපදයට හා ඉන්දියාවට කලාපීය පමනක් නොව වඩ වඩා ගෝලීය වගකීම් පවතින බව ප්‍රකාශ කරමිනි. මෙහි දී “ගෝලීය” යන පදය භාවිත කිරීම, ජාත්‍යන්තර කටයුතුවල දී වඩා වැඩි කාර්ය භාරයක් වෙනුවෙන් ඉන්දියානු පාලක ප්‍රභූවට පවත්නා අභිලාෂයන් පිලිගැනීමකි.

තිරයට පිටුපසින්, සාකච්ඡා තරමක් තියුනු ස්වභාවයක් ගත් බව සිතා ගත හැකි ය. සංචාරයට සූදානම් වීමක් වසයෙන්, නව දිල්ලියේ එක්සත් ජනපද තානාපති ඩේවිඩ් මල්ෆොර්ඩ් ඉන්දියානු ඛනිජ තෙල් ඇමති මනි ශන්කර් අයියර් හමු වී නල මාර්ග ව්‍යාපෘතිය පිලිබඳ එක්සත් ජනපදයේ “උත්සුකතා” ප්‍රකාශ කලේ ය. ඉරානයේ බල ශක්ති අංශය තුල එක්සත් ජනපද ඩොලර් මිලියන 20කට වඩා ආයෝජනය කරන රටවලට සම්බාධක පැනවීමේ විධිවිධාන සහිත 1996 ඉරාන-ලිබියා සම්බාධක පනත යටතේ එක්සත් ජනපදය විසින් ගනු ලැබෙන ආර්ථිකමය පලිගැනීමේ පියවරයන්ට මුහුන දීමට ඉන්දියාවට සිදු විය හැකි බවට ඔහු ඉඟි කලේ ය.

ඉන්දියාවේ දී, රයිස් අවධාරනය කලේ එක්සත් ජනපදය “ඉරානය හා ඉන්දියාව අතර ගෑස් නල මාර්ග සහයෝගිතාව සම්බන්ධයෙන් (තමන්ට පවත්නා) උත්සුකතා ඉන්දියානු ආන්ඩුවට දැනුම් දී” ඇති බව යි. ඉන්දියාවේ පල කෙරෙන *rediff.com* වෙබ් අඩවියට ඇය මෙසේ පැවසී යඃ “අපට ඉරානය සමග සමහර ප්‍රශ්න පවතී. ඒ මක් නිසා ද කිය තොත්, එම රට ත්‍රස්තවාදී කටයුතුවල යෙදෙන බැවිනි, සිය අසල්වැසි රටවල කටයුතුවලට ඇඟිලි ගසන සහ එක්සත් ජාතීන්ගේ සම්බාධකවලට ද මුහුන දී සිටින බැවිනි. එබැවින් අපි ඉන්දියාවට අපගේ උක්සුකතා ප්‍රකාශ කලා පමනක් නොව, ඉරානය සමග ගෑස් ව්‍යාපෘතිය නතර කරන ලෙස ජපානයෙන් ද ඉල්ලා සිටියෙමු.”

රයිස් ඉරානයට එරෙහිව වොෂිංටනය ඉදිරිපත් කරන ප්‍රධාන චෝදනාව තරමක් යට ගැසීම අර්ථභාරී යඃ එනම්, එම රට න්‍යෂ්ටික ආයුධ වර්ධනය කිරීමේ යෙදී සිටී යන්න යි. මෙම දෙබිඩි පිලිවෙත ද මුලුමනින් ම පැහැදිලි යඃ ටෙහෙරානය න්‍යෂ්ටික බෝම්බයක් තැනීමේ ප්‍රයත්නයක යෙදී සිටින්නේ ය යන ඔප්පු නොකල චෝදනා මත බුෂ් ආන්ඩුව ටෙහෙරානයට විරුද්ධව එක්සත් ජාතීන්ගේ සම්බාධක ඉල්ලා සිටින අතර ම, න්‍යෂ්ටික ආයුධයක් නිපදවා අත්හදා බලා ඇති ඉන්දියාව මත පැනවුනු ආර්ථික සම්බාධක ලිහිල් කිරීමට එක්සත් ජනපදය පියවර ගෙන තිබේ.

තථ්‍ය වසයෙන් ගත් කල, නව දිල්ලිය ඉරාන ගෑස් නල මාර්ග ව්‍යාපෘතිය අත්හැර දමන්නේ නම්, ඉන්දියාව සමග න්‍යෂ්ටික සහයෝගිතාව සම්බන්ධයෙන් 1974 දී පනවන ලද තහංචිය ඉවත් කිරීමට එක්සත් ජනපදය පියවර ගැනීමේ ඉඩ ප්‍රස්ථාවක් ඇතැයි රයිස් පෙන්නුම් කලා ය. න්‍යෂ්ටික බලාගාර ඉදි කිරීමෙහි ලා ඉන්දියාවට සහාය වීමට වොෂිංටනය සලකා බලනු ඇතැයි

වසරකට ඉහත දී එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ් නිවේදනය කලේ ය. "එහි අවශ්‍යතාවන් පවතින බැවින් ඉන්දියාව සමග වඩා පුලුල් බල ශක්ති සාකච්ඡාවක් දියත් කල යුතු යැයි (අපි) විශ්වාස කරමු." යැයි රයිස් ප්‍රකාශ කලේ ය.

සිවිල් අරමුනු සඳහා න්‍යෂ්ටික ප්‍රතිකාරක සැපයීම ද ආරක්ෂක හා ආර්ථික සබඳතා ද ඇතුලත් ඉන්දු-එක්සත් ජනපද මූලෝපායික හවුල්කාරිත්වය වර්ධනය කිරීමේ ඊලඟ පියවර ගැනීමට වොෂිංටනය කටයුතු කරනු ඇතැයි එක්සත් ජනපද රාජ්‍ය ලේකම් පැවසුවා ය. එක්සත් ජනපදය පකිස්තානයට මෙන් ම ඉන්දියාවට ද සංකීර්න එෆ්-16 ප්‍රහාරක යානා අලෙවි කිරීමට ඉඩ ඇතැයි ද ඇය සඳහන් කලා ය.

ඉරාන නල මාර්ගයට වොෂිංටනය දක්වන විරුද්ධත්වය නව දිල්ලියට දේශපාලන උභතෝකෝටිකයක් මතු කරයි. එක්සත් ජනපදය සමග ඇති කර ගැනෙන සමීප මිලිටරි සහ ආර්ථික සබඳතා නව දිල්ලියට වාසි අත්පත් කර දෙන අතර ම, බුෂ් ආන්ඩුවේ ඉල්ලීම, ඉරානය සමග ඉන්දියාවේ සබඳතා ද වඩා පුලුල් ලෙස මැද පෙරදිග හා මධ්‍යම ආසියාව තුල ඉන්දියාවේ අභිලාෂයන් ද සමග ඍජුව ම ගැටෙයි. ඉන්දියාව දැනට සිය තෙල් අවශ්‍යතාවන්ගෙන් සියයට 70ක් ආනයන කල යුතු අතර එම සංඛ්‍යාව ඉහල යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එක්සත් ජනපද ආස්ථානය, දෙරට අතර දිගු කලක් තිස්සේ පවතින ගැටුම් විසඳා ගැනීමේ ඉන්දු-පකිස්තාන සාකච්ඡා පිටුපසින් ඇති ප්‍රධාන ආර්ථික ගාමකයකට ද වල කපයි. මේ දැන් සාකච්ඡා එක තැන සිර වී ඇති නමුදු, ඉරානයේ සිට පකිස්තානය හරහා ඉන්දියාව දක්වා දිවෙන ගෑස් නල මාර්ගයක් මගින් ගෙන එනු ලබන විභවීය දැවැන්ත ආර්ථික වාසි දෙස නව දිල්ලිය හා ඉස්ලාමාබාදය යන දෙපාර්ශ්වය ම බලාපොරොත්තු දල්වා ගෙන සිටී. වොෂිංටනය සාකච්ඡා සඳහා බල කර ඇති නමුදු, ඉරානය සම්බන්ධයෙන් එය ගෙන යන යුදකාමී පිලිවෙත ඉන්දියානු උප-මහාද්වීපයේ සාකච්ඡාමය විසඳුමක් සඳහා පවතින අවකාශයන්ට ඍජුව ම වල කපයි.

ඉන්දියාවේ ප්‍රසිද්ධ ප්‍රතිචාරය වී ඇත්තේ එක්සත් ජනපද ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමයි. සිය ඒකාබද්ධ ප්‍රවෘත්ති සාකච්ඡාවේ රයිස් සමග එක පෙලට සිටිමින්, ඉන්දියානු විදේශ ඇමති සිං කෙලින් ම මෙසේ සිය අදහස ප්‍රකාශ කලේ යː "අපට ඉරානය සමග මොන යම් හෝ ආකාරයක ගැටලුවක් නැත. අපගේ බල ශක්ති මූලාශ්‍රයන්ට බොහෝ දේ අලුතෙන් එකතු කර ගැනීම අපට අවශ්‍ය ය. එබැවින් නල මාර්ගය වැදගත් ය."

කෙසේ වෙතත්, එක්සත් ජනපදය යොදන පීඩනය යම් බලපෑමක් ඇති කරමින් තිබේ. "ඉරාන ගෑස් මිල ගනන් ඉහල වීම සහ විශ්වාසනීයත්වයෙන් අඩු පකිස්තානය හරහා නල මාර්ගය වැටීම මගින් මතු කෙරෙන ස්ථානික ආරක්ෂක ගැටලු වැනි කරුනු සහ තවත් කාරනා ඇතුලු හේතු ගනනාවක්" සඳහන් කරමින්, ඉන්දියාව නල මාර්ගය පිලිබඳ එකඟතාවයෙන් ඉවත් වීමට සලකා බලන බව, *ඒසියා ටයිම්ස්* වෙබ් අඩවියේ පල වූ ලිපියක් යෝජනා කලේ ය.

**එක්සත් ජනපදය සමග පවත්නා සබඳතා පිලිබඳ උත්සුකතා**

හුදෙක් නල මාර්ගය පමනක් නොව, සුවිශේෂව ම එක්සත් ජනපදය හා බුෂ් ආන්ඩුව සමග සමීප සබඳතාවකින් මතු කෙරෙන අන්තරායන් ද පිලිබඳව උත්සුක වී ඇති, ඉන්දියානු පාලක ප්‍රභූවේ ස්ථර අතර වොෂිංටනයේ ආස්ථානය මගින් විරුද්ධත්වයක් ද අවුලුවනු ලැබ ඇත. ඉන්දියාවට හා ඉරානයට "තමන් එකිනෙකා සමග කටයුතු කිරීමේ දී එක්සත් ජනපදයේ ආශිර්වාදය අවශ්‍ය නොවේ" යැයි *හින්දු* පුවත්පත කෙලින් ම ප්‍රකාශ කලේ ය.

ඉන්දියාවේ තෙල් ඇමති මනි ශන්කර් අයියර් මාධ්‍යවලට මෙසේ පැවසී යː "(ඉරානය සමග) මෙම සබඳතාව කිසිදු තෙවන පාර්ශ්වයක උත්සුකතාවන් සමග සම්මුති ගැස්විය නො හැකි ය. . . . ලෝකයේ සියලු ම මිත්‍රශීලී රටවල් පිලිගත යුතු කරුනක් නම්, ඔවුන්ට ජාතික උත්සුකතා පවතිනවා වුවත්, අපට ඉතා වැදගත් බල ශක්ති අවශ්‍යතාවක් පවතින බව යි. එම අවශ්‍යතාව සපුරාගැනීමෙන් තොරව අපගේ ප්‍රමුඛතා පවත්වා ගෙන යාම ගැන බලාපොරොත්තු තැබිය නොහැකි ය."

*ටයිම්ස් ඔෆ් ඉන්දියා* පුවත්පත පරෙස්සම් සහගතව මෙසේ සඳහන් කලේ යː "ඉරාන නල මාර්ගය එක්සත් ජනපද විදේශ පිලිවෙතට අංශක 180කින් විරුද්ධ මාවතක් නියෝජනය කරයි. . . . මනි ශන්කර් අයියර්ගේ සැලසුම් ඵල දැරුව හොත්, එවිට අවසානයේ දී නල මාර්ග ජාලය කැස්පියන් මුහුදේ සිට චීනය දක්වා විහිදෙනු ඇත. එය, කලාපයේ අධිපති ක්‍රියාකලාපයක් ඉටු කිරීමේ අවශ්‍යතාවෙන් පෙලෙන බුෂ් පාලනාධිකාරයේ උද්යෝගයට හේතු වීමට ඉඩ නැත."

මැද පෙරදිග ගෑස් සැපයුම්කරුවන් චීනය හා කොරියාව ඇතුලු ආසියානු ගෑස් පාරිභෝගිකයන් සමග සම්බන්ධ කරන අභිලාෂමත් ආසියානු ගෑස් නල ජාලයක් පිලිබඳ අදහසක් පසුගිය මාසයේ දී අයියර් යෝජනා කලේ ය. ඉන්දියාවේ තෙල් සහ ස්වභාවික වායු සංස්ථාව පසුගිය වසර හතරක කාලය තුල රුසියාව, ඉරානය, වියට්නාමය සහ බුරුමය ඇතුලු රටවල් ගනනාවක ඩොලර් බිලියන 5ක පමන මුදලක් දැනටමත් ආයෝජනය කර ඇත. ඉරානයෙන් පමනක් නොව, තර්කිමේනිස්තානයෙන් මෙන් ම බුරුමයෙන් ද ගෑස් ප්‍රවාහනය කිරීම පිලිබඳව මේ මස මුල දී

ඉන්දියානු කැබිනට් මන්ඩලයේ දී සාකච්ඡා කෙරුනි.

වැඩෙන ආර්ථික සහයෝගිතාව සමග එකට යමින් නව දිල්ලිය විශේෂයෙන් ම චීනය හා රුසියාව සමග සමීප භූලෝපායික සබඳතා සඳහා පවත්නා ඉඩකඩ ගවේෂනයෙහි ද යෙදී සිටී. පසුගිය වසරේ මොස්කව්හි කල කතාවක දී, අයියර් පැවති සෝවියට් සංගමය සමග ඉන්දියාව පවත්වා ගෙන ගිය සබඳතා ප්‍රශංසාවට ලක් කලේ ය. "ස්වාධීනත්වයෙන් පසුව ගත වූ ප්‍රථම අඩ සියවස තුල දී, . . . රුසියාව අපගේ භෞමික අඛන්ඩතාව සහතික කල අතර දෙවන අර්ධයේ දී එයට අපගේ බල ශක්ති ආරක්ෂාව සහතික කිරීමට හැකි වනු ඇත." යැයි ඔහු ප්‍රකාශ කලේ ය.

දෙසැම්බරයේ දී ඉන්දියාවේ සංචාරයක යෙදෙමින්, රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින්, ආර්ථික කටයුතු සම්බන්ධයෙන් පමනක් නොව, ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් ද තම දෙරට හා චීනය අතර සමීප සබඳතා ඇති කර ගත යුතු යැයි ඉල්ලා සිටියේ ය. තම රටවල් තුන "ගෝලීය ආරක්ෂාව සඳහා දැවැන්ත ප්‍රතිපදානයක් කරනු ඇතැ"යි පුටින් ප්‍රකාශ කලේ ය. චීන අගමැති වෙන් ජියාබෝ අප්‍රේල් මස ඉන්දියාවේ සංචාරයක යෙදීමට නියමිත ය. ඉරානයේ විශාලතම සාගර තෙල් බිම වන යදවරාන් මෙන් ම ජුයිෆර් තෙල් බිම ද සංවර්ධනය කිරීමෙහි ලා ඉන්දියාව චීනය සමග සහයෝගීව කටයුතු කරයි.

ඉරාන නල මාර්ගය අතහැර දමන ලෙස එක්සත් ජනපදය කරන ඉල්ලීම ඉන්දියාවේ සෙසු සබඳතාවන්ට ද වක්‍රාකාරයෙන් තර්ජනයක් මතු කරයි. භූලෝපායික, සම්පත්වලින් පොහොසත් මැද පෙරදිග හා මධ්‍යම ආසියානු කලාප මත්තෙහි ස්වකීය බලග්‍රහනය තහවුරු කර ගැනීමට අධිෂ්ඨානවත්ව සිටින බුෂ් පාලනාධිකාරයට ඉන්දියාව, රුසියාව හා චීනය අතර ආර්ථික හා භූලෝපායික හවුලක් වර්ධනය වීමේ අවකාශය ගෝචර නොවේ. ඉන්දියාව සමග වඩා සමීප සබඳතා තහවුරු කර ගැනීමේ රයිස්ගේ ප්‍රයත්නයන් හුදෙක් ඉරානයට එරෙහිව එල්ල වූවක් නොව, එක්සත් ජනපද අවශ්‍යතාවන්ට එල්ල වන ඕනෑම විරුද්ධත්වයකට -- විශේෂයෙන් ම චීනය දෙසින් එල්ල වන විරුද්ධත්වයකට -- එරෙහිව එල්ල වූවකි.

### පකිස්තානය මත පීඩනය

රයිස් ඉස්ලාමාබාද්හි දී ද නව දිල්ලියේ දී කල ප්‍රකාශයට සමාන පනිවිඩයක් නිකුත් කලා ය. "වෙලඳ සබඳතා හෝ වෙනත් මාර්ගයකින් හෝ ඉරානය ශක්තිමත් කිරීමට ගැනෙන මොන යම් හෝ පියවරක් එක්සත් ජනපදයේ අමනාපයට පාත්‍ර වනු ඇත." යැයි ඇය මාධ්‍යවලට පැවසුවා ය. ගෑස් නල මාර්ග ව්‍යාපෘතිය අතහැර දැමීම, කෙසේ වෙතත්, පකිස්තානයට ප්‍රධාන ආර්ථික පහරක් වනු ඇත. "සාම නල මාර්ගයෙන්" ලැබීමට නියමිත ඩොලර් මිලියන 200 හා 300 අතර වෙතැයි තක්සේරු කෙරෙන වාර්ෂික සංක්‍රමන ගාස්තුව එරටට සැලකිය යුතු මූල්‍යමය රුකුලක් වනු ඇත.

ඉරානය ඇතුලු රටවල් ගනනාවකට න්‍යෂ්ටික තාක්ෂනය අලෙවි කිරීමෙහි ලා නිමග්න වූ න්‍යෂ්ටික විද්‍යාඥ ඒ.කිව්. ඛාන්ගේ වැඩ කටයුතු සම්බන්ධයෙන් තොරතුරු එලිදරව් කිරීමට පකිස්තානය කටයුතු කල යුතු ය යන එක්සත් ජනපද ඉල්ලීම ද රයිස් යලි අවධාරනය කලා ය. ඛාන්ගේ ක්‍රියාකාරකම් පිලිබඳ විස්තර ඉරානයට එරෙහිව තමන් ගොතන අතිශය දුර්වල චෝදනා පත්‍රය ශක්තිමත් කරනු ඇතැයි වොෂිංටනය පැහැදිලිව ම බලාපොරොත්තු වේ.

පකිස්තානයට ඉන්දියාවට තරම් විකල්පයන් නැත. එක්සත් ජනපදයට එල්ල වු 2001 සැප්තැම්බර් ප්‍රහාරයෙන් ඉක්බිතිව, ජනාධිපති පර්වෙස් මුෂාරෆ් බුෂ් පාලනාධිකාරය සමග මුලුමනින් ම ඒකාබද්ධ වීමට තීන්දු කොට, ඇෆ්ඝනිස්තානයේ තලිබාන් තන්ත්‍රය අතහැර දමා එක්සත් ජනපදයේ නායකත්වයෙන් එම රට තුලට සිදු කෙරුනු මිලිටරි මැදිහත්වීමට සෘජුව ම සහාය දුනි. එයට හිලව් වසයෙන් මූල්‍යමය හා වෙනත් ආකාර අල්ලස් ලැබුනු නමුත්, එක්සත් ජනපද ආක්‍රමනයට ඔහුගේ ප්‍රකට සහයෝගය රට තුල සැලකිය යුතු මට්ටමේ විරුද්ධත්වයක් අවුලුවාලී ය.

හදිසි භූ-දේශපාලනික අවශ්‍යතාවක් නොමැති වූ කල එක්සත් ජනපදය පහසුවෙන් පකිස්තානය අතහැර දැමීමට ඉඩ ඇත යන්න පිලිබඳව පකිස්තාන ප්‍රභූව තුල පවත්නා නොසන්සුන්තාව සමනය කිරීමට ද රයිස් ප්‍රයත්න දැරුවා ය. "එක්සත් ජනපදය ජීවිත කාලයට ම මිතුරෙක් වනු ඇත." යැයි ඇය පැවසුවා ය. "සීතල යුද කාල පරිච්ඡේදය තුල දී භූලෝපායික අවශ්‍යතා බෙදා හදා ගැනීමෙන් පසුව, අපගේ ඉතිහාසයේ එක අවස්ථාවක දී අප පකිස්තානය සමග ගැඹුරු සබඳතා අඛන්ඩව පවත්වා ගැනීමක් සිදු නො කල බව අපි අවබෝධ කර ගෙන සිටිමු. අප එක්සත් ජනපදයේ දී ඒ වෙනුවෙන් වන්දියක් ගෙවූ බවත් පකිස්තානය ද එලෙස වන්දියක් ගෙවූ බවත් මම විශ්වාස කරමි. එබැවින් අපි මෙම දිගු-කාලීන සබඳතාවට දිගට ම කැපවී ගමු, කැප වී ගන්නෙමු."

කෙසේ වෙතත්, ඉස්ලාමාබාද් පාලනයට උත්සුකතා සඳහා ඇති තරම් හේතු පවතී. පකිස්තානය ඉරානයට එරෙහිව දේශපාලනික සහයෝගය හා හැකි නම් මිලිටරි සහයෝගය දිය යුතු යයි වොෂිංටනය පැහැදිලිව ම බල කරමින් සිටී. පරිනත මාධ්‍යවේදියකු වන සෙමොර් හර්ෂ් විසින් නිව් යෝර්කර් පුවත්පතට සපයන ලද මෑත ලිපියක්, ඉරානය තුල රහස් මෙහෙයුම් ද ඇතුලත්, ඉරානයට එරෙහි එක්සත් ජනපද මිලිටරි සැලසුම් පිලිබඳ විස්තර සම්පාදනය කලේ ය. එක්සත් ජනපද පරීක්ෂන නිලධාරින්ට ඛාන් භාර දීම පකිස්තානය ප්‍රතික්ෂේප කර ඇති නමුදු, හර්ෂ්ගේ එක් මූලාශ්‍රයක්

පැහැදිලි කොට ඇති පරිදි, දකුනු ආසියාවේ ක්‍රියාත්මක වන පෙන්ටගන් කාර්ය සාධක බලකායකට ඉරානය සමග ගනුදෙනුවලට සම්බන්ධිත බාන්ගේ කන්ඩායමේ සාමාජිකයන්ට ප්‍රවිෂ්ට වීමේ අවසරය ලැබී ඇත. ඇත්ත වසයෙන් ම පකිස්තානය මෙම කරුනු ප්‍රතික්ෂේප කොට තිබේ.

එක්සත් ජනපදය හා ඉරානය අතර යුද්ධයක් ඇති වුව හොත් පකිස්තානය මධ්‍යස්ථව සිටිනු ඇතැයි මුෂාරෆ් මෑතක දී ඇඟවුම් කලේ ය. මෙම ප්‍රකාශය එක්සත් ජනපදයේ නායකත්වයෙන් ඉරාකය ආක්‍රමනය කිරීම සම්බන්ධයෙන් ඉස්ලාමාබාදය ගත් ආකාරගත ආස්ථානයෙන් වෙනසක් නියෝජනය කරයි. එහි දී පකිස්තානය එම යුද්ධයේ නීත්‍යනුකූල භාවය පිලිබඳ ඇල් මැරුනු විවේචන කල කන්ඩායමට එක් විය. ඔවුන්ගේ ඊනියා ත්‍රස්ත විරෝධී යුද්ධය සම්බන්ධයෙන් දැනට වඩා යමක් කල යුතු බවට එක්සත් ජනපදයෙන් එල්ල වන පීඩනයට මුෂාරෆ් අඛන්ඩව මුහුන දෙන වග පැහැදිලි ය. ඒ සම්බන්ධයෙන් මුෂාරෆ්ගේ පාර්ශ්වයෙන් සිදු විය හැකි මොන යම් හෝ ප්‍රතික්ෂේප කිරීමක් වොෂිංටනයේ අසතුටට හා ව්‍යසනකාරී විභවයකින් යුත් ආර්ථික හා දේශපාලනික ප්‍රතිවිපාකවලට තුඩු දීමේ අවදානම දරයි.

මුෂාරෆ්ට දුන් පැහැදිලි අල්ලසක් ලෙස, පසුගිය සිකුරාදා බුෂ් පාලනාධිකාරය නිවේදනය කලේ, පකිස්තානයේ හමුදා බලඇනියේ මට්ටම ඉහල දැමීම පිනිස මහත් අවශ්‍යතාවක්ව පැවති එෆ්-16 ප්‍රහාරක ගුවන් යානා පකිස්තානයට අලෙවි කරන බව යි. මෙම යුද ගුවන් යානා න්‍යෂ්ටික ප්‍රහාරයක් එල්ල කිරීමේ හැකියාව සඳහා පකිස්තානයට තීරනාත්මක වන අතර එම හේතුව නිසා ම නව දිල්ලිය එයට විරුද්ධත්වය දක්වා ඇත. තමන් කිසිදු අගතියකින් තොරව සාධාරනව කටයුතු කරන බවක් පෙන්වීමේ ප්‍රයත්නයක් ලෙස, වොෂිංටනය, ඉන්දියාවට එෆ්-16 හා එෆ් 18 යානා මිලට ගැනීමට හෝ බලපත්‍රයක් යටතේ ඒවා නිපදවීමට හෝ ඉඩ දිය හැකැයි යනුවෙන් යෝජනාවක් ද කර තිබේ. කෙසේ වෙතත්, පකිස්තානය සිදු කරන මිලට ගැනීම මෙන් නොව, ඉන්දියාව සමග මෙම ගනුදෙනුව තරමක් අවිනිශ්චිත ය.

එක්තරා ජයග්‍රාහී ලීලාවකින් ඉස්ලාමාබාදය ප්‍රකාශ කලේ, එෆ්-16 යානා මිලදී ගැනීමේ අවසරය කිසිදු කොන්දේසියක් සමග සම්බන්ධ කොට නැති බව යි. විශේෂයෙන් ම, ඉරාන ගෑස් නල මාර්ග ව්‍යාපෘතිය අතහැර දැමීම එහි කොන්දේසියක් නොවේ. එහෙත් පකිස්තානයට පැහැදිලිව ම යම් මිලක් -- ඉරානයට එරෙහි එක්සත් ජනපද යටි උගුල් ඇදීම සමග වඩා සමීපව සහයෝගී වීමක් ඇතුලු -- ගෙවීමට තිබුනි. සිය න්‍යෂ්ටික කේන්ද්‍රාපසාරකවල කොටස් පරීක්ෂාව සඳහා ජාත්‍යන්තර පරමානුක බල ඒජන්සියට යැවීම ගැන පකිස්තානය සලකා බලමින් සිටින බව, වොෂිංටනයේ නිවේදනයට ක්ෂනික පෙරාතුව, මුෂාරෆ් *ආජ් ටීවී* නාලිකාවට පැවසී ය. එම පියවර වනාහි ඉරානයට එරෙහිව එක්සත් ජනපදය ගොතන චෝදනා පත්‍රයට සහාය පිනිස සැලසුම් කෙරුනකි.

නව දිල්ලිය එක්සත් ජනපදයේ තීන්දුව පිලිබඳව පැහැදිලිව ම කෝපාවිශ්ටව සිටී. අගමැති මන්මෝහන් සිං බුෂ්ට සිය "මහත් අපේක්ෂාභංගත්වය" ප්‍රකාශ කොට එම පියවර "ඉන්දියාවේ ආරක්ෂක වටපිටාව සම්බන්ධයෙන් නිෂේධනාත්මක ප්‍රතිවිපාක ඇති කල හැකි" බව පැවසී ය. ඉන්දියාව නොතකා හරින බවට එක්සත් ජනපදයට චෝදනා කරමින් ඉන්දියාවේ සමහර මාධ්‍ය තුල විවේචන අවුලුවාලීමට ද එක්සත් ජනපද තීන්දුව තුඩු දී ඇත. "ඉන්දියාවේ සංවේදිතාවන් සිතෙහි තබා ගැනීම එක්සත් ජනපදයට වඩා ගෝචර" යැයි ආරක්ෂක විශ්ලේෂක බ්‍රිගේඩියර් ගුර්මීට් කන්වාල් අනතුරු ඇඟවී ය.

පකිස්තානයේ මිලිටරි ආස්ථානය ශක්තිමත් කරන මෙම ආයුධ අලෙවිය දෙරට අතර පවත්නා දැනටමත් දුර්වල මට්ටමක ඇති සාම ක්‍රියාදාමයට තව දුරටත් වල කපනු ඇත. වඩාත් අති මූලිකව ගත හොත්, එයින් අවධාරනය කෙරෙන්නේ, ඇෆ්ඝනිස්තානය හා ඉරාකය තුල බුෂ් පාලනාධිකාරය කිසිදු වග විභාගයකින් තොරව ක්‍රියාවට දමා ඇති මිලිටරිවාදී පිලිවෙතත් දැන් එය ඉරානයට එරෙහිව ගෙන යන ආක්‍රමනික ආස්ථානයත්, ඉන්දියානු උප-මහාද්වීපය තුල ප්‍රගාඪ අස්ථාවරකරන සාධක ලෙස ක්‍රියාත්මක වන බවයි.

©
www.wsws.org